

2021

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்திர செயல்திறன் அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

இலங்கை தேசிய புலமைச் சொத்து அலுவலகம்

National Intellectual Property Office of Sri Lanka

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2021

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

CM - 039108 - 16 (2023/11) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

අන්තර්ගතය

	පිටුව
පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ	1-8
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	9-28
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	29-61
පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක	63-65
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	67-69
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	71-76
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව	77-92

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3 ප්‍රධාන කාර්යයන්

1.4 සංවිධාන සටහන

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

1.1 හැඳින්වීම

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයට ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පද්ධතිය පරිපාලනය කිරීම සම්බන්ධ බලය පැවරී ඇත.
ඕනෑම රටක සමස්ත ආර්ථික සංවර්ධනයේ දී, විශේෂයෙන් දැනුම ප්‍රධාන වශයෙන් සක්‍රිය සහ නිසැක වශයෙන්ම වැදගත් වන වර්තමාන සන්දර්භය තුළ බුද්ධිමය දේපළ අත්‍යවශ්‍ය සහ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. මානව ප්‍රයත්නයන් ක්‍රියාත්මක වන සෑම ක්ෂේත්‍රයක් සඳහාම ආයෝජන, නවෝත්පාදන හා නිර්මාණශීලී ක්‍රියාකාරිත්වය, තාක්ෂණ හුවමාරුව සහ දැනුම් ප්‍රවාහයේ අවශ්‍යතාව ඉතිහාසයේ කවර කළකටත් වඩා වර්තමානයේ දී ශ්‍රී ලංකාව ද අත් විඳිමින් පවතී. සමාලෝචනයට භාජනය කරනු ලබන 2021 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පරිපාලනය සඳහා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් සිදු කරන ලද කාර්යයන් පිළිබඳව සංක්ෂිප්ත විස්තරයක් මෙම වාර්තාව මගින් ඉදිරිපත් කෙරෙනු ඇත.

එයටම ආවේණික සුවිශේෂී ලක්ෂණ සහිතවන බුද්ධිමය දේපළ වනාහි, එක් දේපළ ආකාරයක් ලෙස හැඳින්විය හැකි ය. මානව බුද්ධිය මෙහෙයවා සිදුකරන නිර්මාණාත්මක කාර්යය සඳහා නීතිමය වශයෙන් බලාත්මක කළ හැකි අයිතිවාසිකම් කාණ්ඩය බුද්ධිමය දේපළ ලෙස සැලකේ. සාහිත්‍ය, කලා හෝ විද්‍යාත්මක කාර්යයන්, ප්‍රාසාංගික කලා ශිල්පීන්ගේ රහ දැක්වීම්, හඬ තැටි, විකාශය කිරීම්, නව නිපැයුම්, කාර්මික සැලසුම්, වෙළඳ ලකුණු, සේවා ලකුණු, වාණිජ නම් සහ තනතුරු, අසාධාරණ තරඟයට එරෙහිව ආරක්ෂාව, භූගෝලීය දර්ශක, හෙළිදරවු නොකළ තොරතුරු සහ සංයුක්ත පරිපථ සඳහා වූ පිරිසැලසුම් නිර්මාණ වැනි ක්ෂේත්‍රවලට අදාළ අයිතිවාසිකම් මීට ඇතුළත් වේ. පුද්ගලයන් විසින් හිමිකාරිත්වය දරන අනෙකුත් දේපළ ආශ්‍රිතව දක්නට ලැබෙන සමහර ලක්ෂණ බුද්ධිමය දේපළ සඳහා ද පොදු වේ. උදාහරණයක් ලෙස, බුද්ධිමය දේපළ වත්කමක් වන අතර එයට මූල්‍යමය වටිනාකමක් ද සහිත වේ. අනිත් ඕනෑම ආකාරයක දේපළක් සඳහා මෙන්ම බුද්ධිමය දේපළ සඳහා ද හිමිකරගැනීම, වෙනත් පාර්ශවයක් වෙත අයිතිය පැවරීම, විකිණීම හෝ බලපත්‍ර ගිවිසුම්ගත වීම ආදිය සිදුකළ හැකි ය. බුද්ධිමය දේපළ හඳුනාගැනීම හෝ එහි භෞතික පරාමිති මගින් නිශ්චය කරගැනීම හෝ සිදුකළ නොහැකි බැවින් බුද්ධිමය දේපළ යනු අස්පර්ශනීය දේපළකි. එසේ වුව ද, බුද්ධිමය දේපළ ආරක්ෂා කරගැනීම සඳහා එය ප්‍රත්‍යක්ෂ ආකාරයකට හෝ ක්‍රමයකට නිශ්චිතව පළ කළයුතු වේ.

කාර්මික දේපළ සහ ප්‍රකාශන හිමිකම් වශයෙන් බුද්ධිමය දේපළ ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදේ. එනම්,

1. නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර, වෙළඳ ලකුණු සහ සේවා ලකුණු, කාර්මික සැලසුම් සහ භූගෝලීය දර්ශක අන්තර්ගත **කාර්මික දේපළ** සහ,

2. ශාස්ත්‍රීය හා කලාත්මක කෘති ආවරණය කරන ප්‍රකාශන හිමිකම්, ප්‍රාසාංගික කලාකරුවන්ගේ ශාබ්දික පටිගත කිරීම් හෝ තැටිගත කිරීම්, නිෂ්පාදකයන්ගේ සහ විකාශන ආයතනවල අයිතිවාසිකම් සම්බන්ධිත අයිතිවාසිකම් හෝ ආශ්‍රිත අයිතිවාසිකම් යනුවෙන් හැඳින් වේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

වෙළඳ පොළ කේන්ද්‍රීය බුද්ධිමය දේපළ පද්ධතියක් දේශය වෙත ළඟාකර දීමේ අභිප්‍රායෙන් යුතුව ගුණාත්මක බව අරමුණු කරගත් ඵලදායී සේවා සපයන ප්‍රධාන පෙළේ රාජ්‍ය ආයතනයක් බවට පත්වීම.

මෙහෙවර

බුද්ධිමය දේපළ නිර්මාණය, ආරක්ෂා කිරීම හා වාණිජකරණය ඔස්සේ ආර්ථික තිරසාරත්වය ප්‍රවර්ධනය කරන බුද්ධිමය දේපළ පද්ධතියක් ස්ථාපනය වීම සහතික කිරීම.


අරමුණු

i. ජාතියේ නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය කිරීම
ii. වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැලසීම
iii. ආයෝජන ප්‍රවර්ධනය
iv. පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම සහ දැනුම මූලික කර ගත් ගෝලීය ක්‍රියාකාරීත්වයට ජාතික ආර්ථිකය ඒකාබද්ධ කිරීම

1.3. ප්‍රධාන කාර්යයන්

- වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර, කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම සහ සාමූහික සංගම් ලියාපදිංචි කිරීම හා පරිපාලනය කිරීම ඇතුළුව බුද්ධිමය දේපළ පරිපාලනය කිරීම
- බුද්ධිමය දේපළ පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සහ ප්‍රචලිත කිරීම
- බුද්ධිමය දේපළ විෂය පිළිබඳ දැනුවත් භාවය ප්‍රවර්ධනය කිරීම
- ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සඳහා බුද්ධිමය දේපළ භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම
- බුද්ධිමය දේපළ ආශ්‍රිත ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වගකීම සපුරාලීම සහ ඒ පිළිබඳ කලාපීය සහ අන්තර්ජාතික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම
- බුද්ධිමය දේපළ පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා කිරීම
- ප්‍රකාශන අයිතිය සහ සම්බන්ධිත අයිතිවාසිකම් පිළිබඳ ක්ෂේත්‍රයේ ආරවුල් නිරාකරණය; බුද්ධිමය දේපළ අයිතිවාසිකම් බලාත්මක කිරීමට පහසුකම් සැලසීම
- බුද්ධිමය දේපළ නියෝජිතයන් ලියාපදිංචි කිරීම සහ පරිපාලනය.

1.4 සංවිධාන සටහන


අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (තොරතුරු හා පරීක්ෂණ)
අධ්‍යක්ෂ (නීති)
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා පරීක්ෂණ)
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (පාලන)
ගණකාධිකාරී
සහකාර අධ්‍යක්ෂ (පැලැස්ම)
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (නීති)
අභ්‍යන්තර විගණක
පරීක්ෂක
සංවර්ධන නිලධාරී
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
පරිපාලන නිලධාරී
භාණ්ඩ පරිවර්තක
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
වියදුරු
කාර්යාල කාර්ය සහායක
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
සංවර්ධන නිලධාරී
මුද්‍රණය අදාළ නිලධාරී
සංවර්ධන නිලධාරී
සංවර්ධන නිලධාරී

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ



1.5.1 වෙළඳ ලකුණු අංශය

බුද්ධිමය දේපළ යටතේ කාර්මික දේපළ ලෙස වර්ගීකරණය කර ඇති වෙළඳ ලකුණු සහ සේවා ලකුණු ලියාපදිංචි කිරීමේ කටයුතු ඉටුකරමින් වෙළඳ ලකුණු අංශය විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ විධිවිධාන පරිදි වෙළඳ ලකුණු අයදුම්පතක් එහි ලියාපදිංචි කිරීමේ කටයුතු සිදුකිරීම දක්වා සංකීර්ණ ක්‍රියාවලියකට භාජනය වේ.

පළමුව අයදුම්පත් එහි විධිමත් භාවය සඳහා පරීක්ෂා කෙරෙන අතර විධිමත් භාවය සම්බන්ධ අවශ්‍යතා සම්පූර්ණ කරන්නේ නම් සෝදිසි පරීක්ෂාව බුද්ධිමය දේපළ කාර්යාලයේ පරිගණක පද්ධතිය (IPAS)[1]හරහා සිදු කරනු ලැබේ. එසේ පරීක්ෂා කිරීමෙන් අනතුරුව ලකුණු රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා අතර ප්‍රතික්ෂේපිත අයදුම්පත් සඳහා එකී අයදුම්කරුවන්ට අවශ්‍ය නම් කරුණු විභාග කිරීමකට හෝ ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව ලිඛිත කරුණු දැක්වීමකට යොමු විය හැකි ය. පිළිගනු ලැබූ ලකුණු, පළ කිරීම ගාස්තු (ප්‍රසිද්ධ කිරීමේ ගාස්තු) ගෙවීමෙන් අනතුරුව, රජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන අතර මාස තුනක කාලයකින් අනතුරුව නියමිත ගාස්තු ගෙවීමෙන් පසුව ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කරනු ලැබේ. ප්‍රකාශයට පත්කළ වෙළඳ ලකුණකට එරෙහිව තෙවන පාර්ශවයක් විසින් විරෝධතාවක් ගොනු කරනු ලබන අවස්ථාවක දී, විරෝධතා පරීක්ෂණ ආරම්භ කරනු ලැබිය හැකි අතර එම විරෝධතා පරීක්ෂණය අවසන් කිරීමෙන් අනතුරුව තීරණය ප්‍රකාශයට පත් කරනු ලැබේ. එවැනි

[1] IPAS - කාර්මික දේපළ පරිපාලන පද්ධතිය

තීරණයකින් අගතියට පත්වන පාර්ශවයක් වෙතොත්, ඔවුනට කොළඹ වාණිජ මහාධිකරණයේ අභියාචනයක් ගොනු කිරීමට හැකියාව පවතී.

අධ්‍යක්ෂ (නීති) මෙම අංශයේ ප්‍රධානත්වය උසුලන අතර, සහකාර අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ බුද්ධිමය දේපළ නිලධාරීන් හත් දෙනෙකු, සංවර්ධන නිලධාරීන් දාහතර දෙනෙකු, එක් කළමනාකරණ සේවා නිලධාරිනියක හා කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සිවි දෙනෙකුගෙන් සමන්විත කාර්යමණ්ඩලයක් විසින් මෙම අංශයේ කාර්යයන් ඉටු කරනු ලැබේ.

1.5.2 පේටන්ට් හා කාර්මික සැලසුම් අංශය

පේටන්ට් සහ කාර්මික සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයන් වනුයේ පේටන්ට් අයදුම්පත් පරීක්ෂාකර පේටන්ට් බලපත්‍ර ප්‍රදානය කිරීම හා කාර්මික සැලසුම් අයදුම්පත් පරීක්ෂාකර ලියාපදිංචි කිරීම සම්බන්ධ කටයුතු වේ.

අධ්‍යක්ෂ (තොරතුරු හා පරීක්ෂණ) ප්‍රධානත්වය දරන මෙම අංශය, සහකාර අධ්‍යක්ෂවරු දෙදෙනෙකු, සංවර්ධන නිලධාරීන් හත් දෙනෙකු, කළමනාකරණ සේවා නිලධරයකු, උපාධිධාරී අභ්‍යාසලාභීන් පස් දෙනෙකු හා කාර්යාල කාර්ය සහායක වරයකුගෙන් සමන්විත වේ.

පේටන්ට් සහ කාර්මික සැලසුම් හා සම්බන්ධ තොරතුරු පවත්වාගෙන යෑම පේටන්ට් අංශය මගින් සිදු කරයි. පේටන්ට් සහ කාර්මික සැලසුම් වලට අදාළ තොරතුරු පොදු ජනතාව, විවිධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සහ පාර්ශවකරුවන්ගේ ඉල්ලීම මත ඔවුන් වෙත ලබා දීම මෙන්ම පේටන්ට් සහ කාර්මික සැලසුම් පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම ද සිදු කරයි.

1.5.3 තොරතුරු තාක්ෂණ අංශය

බුද්ධිමය දේපළ ක්‍රියාවලියේ විවිධ පියවර වලට බුද්ධිමය දේපළ කාර්යාලයේ පරිගණක පද්ධතිය වන කාර්මික දේපළ පරිපාලන පද්ධතිය (IPAS-Industrial Property Administration System) යාවත්කාලීන කිරීම, අයදුම්පත් ගොනු කිරීමේ දී පරිගණක පද්ධතිය හරහා අයදුම්පත් ගොනු කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීම, වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම තොරතුරු තාක්ෂණ අංශය යටතේ ඉටු කරනු ලබයි. අධ්‍යක්ෂ (තොරතුරු හා පරීක්ෂණ) ප්‍රධානත්වය දරන මෙම අංශය, සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා පරීක්ෂණ) නිලධරයෙක්ගෙන්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධරයෙක්ගෙන් හා සංවර්ධන නිලධාරීන් දෙදෙනකුගෙන් සමන්විත වේ.

1.5.4 ආයතන අංශය

මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා කාර්යමණ්ඩලය බඳවා ගැනීම, පුහුණු අවස්ථා ලබා දීම සහ යටිතල පහසුකම් සැපයීම ආදී කාර්යයන් ඉටු කිරීම මගින් ආයතනයෙහි සමස්ත ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ආයතන අංශය විසින් ද ඉහළ දායකත්වයක් සපයනු ලබයි. පරිපාලන නිලධාරිනිය විසින් අධීක්ෂණය කරනු ලබන මෙම අංශය භාෂා පරිවර්තක නිලධාරියෙකුගෙන්, සංවර්ධන නිලධාරියෙකුගෙන්, කළමනාකරණ සහකාරවරු සිව් දෙනකුගෙන්, රියදුරන් හතර දෙනෙකුගෙන් හා කාර්යාල කාර්ය සහායකවරු දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

1.5.5 ගිණුම් අංශය

මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සියලුම ආදායම් සරප් කවුළුවක් මගින් භාරගැනීම, ආදායම් නිසි පරිදි වර්ගීකරණය කොට නිවැරදිව ගිණුම් ගත කිරීම, කාර්යාලයීය නිලධාරින් ගේ වැටුප් වෙතන ගෙවීම හා කාර්යාලයීය වියදම් හා ගෙවීම් කටයුතු, ආයතනික ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාකරණය, ප්‍රසම්පාදන කටයුතු හා බුද්ධිමය දේපළ අරමුදලේ අරමුදල් කළමනාකරණය ගිණුම් අංශය සතු ප්‍රධාන කාර්යයන් වේ. මෙම අංශයේ ගණකාධිකාරී අධීක්ෂණය යටතේ නිලධාරින් 11 දෙනෙකු සේවයේ නිරත වේ.
2021 වසරෙහි උද්ගත වූ කොවිඩ් වසංගත තත්ත්වය යටතේ කාර්යාලය වසා තැබූ සහ සීමිත සේවාවන් සපයන ලද කාල සීමාව තුළ සියලු ආදායම් ලබා ගැනීම මාර්ගගත ක්‍රමයට සිදු කිරීම මගින් ආයතනයෙහි සමස්ත ප්‍රගතිය ප්‍රශස්ත මට්ටමකින් පවත්වා ගැනීම සඳහා මෙම අංශය විසින් ද සැලකිය යුතු දායකත්වයක් සපයන ලදි.

1.5.6 සැලසුම් අංශය

ආයතනයෙහි දැක්ම සහ මෙහෙවර ප්‍රකාශ වලට අනුකූල වන ලෙසින්, අරමුණු මුදුන් පත් කර ගැනීම සඳහා උපායමාර්ග සැලසුම සකස් කිරීමත්, ආයතනික ශක්‍යතාව සහ හඳුනා ගන්නා ලද සංවර්ධන විභවතා මත පදනම්ව, ආයතනයෙහි විශේෂිත අරමුණු මුදුන් පත් කර ගැනීම සඳහා වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමත්, එයට අනුකූලව සංවර්ධන ව්‍යාපෘති මෙහෙයවීමත්, අධීක්ෂණය සහ පසු විපරම් කිරීමත්, ප්‍රගතිය විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීමත්, විශේෂයෙන් ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) වෙත ඉදිරිපත් කළයුතු සංඛ්‍යාලේඛන සහ ප්‍රගති වාර්තා අවශ්‍ය විශ්ලේෂණ සහිතව ඉදිරිපත් කිරීමත්, සේවාලාභී ප්‍රඥප්තිය ආයතනය තුළ ස්ථාපිත කිරීම මගින් ආයතනය සහ මහජනතාව අතර අවබෝධය සහ විශ්වසනීයත්වය ඉහළ නැංවීමත්, එමගින් ආයතනික ඵලදායීතාව ඉහළ නැංවීමත්, ආයතනයෙහි මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම සහ නිලධාරින් ගේ කාර්යසාධනය හා සම්බන්ධ සැලසුම් සකස් කිරීමත්, ආයතනයේ ඉලක්ක වලට අනුකූලව දේශීය සහ විදේශීය පුහුණු අවස්ථා හඳුනා ගැනීමත්,

සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ ගෙවීම් කටයුතුවලට අනුකූලව නිර්දේශ ඉදිරිපත් කිරීමත්, ප්‍රසම්පාදන තීරණ ගැනීම සඳහා සහය වීමත්, සැලසුම් අංශයෙහි කාර්යභාරය ලෙස දැක්විය හැකි ය.
ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි සැලසුම් අංශය, සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) වරයකුගෙන් සහ සංවර්ධන නිලධාරින් දෙදෙනකුගෙන් සමන්විත ඒකකයකි.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

- ✓ බුද්ධිමය දේපළ අරමුදල

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

- × නැත

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 වෙළඳ ලකුණු ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

2.2 පේටන්ට් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

2.3 කාර්මික සැලසුම් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

2.4 විශේෂ ජයග්‍රහණ

2.5 අභියෝග

2.6 ඉදිරි ඉලක්ක

2.1 වෙළඳ ලකුණු ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

වගුව - 1 : 2021.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ ලකුණු ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

	ක්‍රියාකාරකම්	ඉටු කරන ලද කාර්ය		
		ඇස්තමේන්තු ගත (සංඛ්‍යාත්මකව)	සත්‍ය (සංඛ්‍යාත්මකව)	%
1	වෙළඳ ලකුණු අයදුම්පත් ලැබීම්	9251	9947	108%
2	නවතාවය පිළිබඳ පරීක්ෂා කිරීම්	9063	4989	55%
3	ලකුණු පිළිගැනීම සහ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධව ලිපි නිකුත් කිරීම	13595	11001	81%
4	වෙළඳ ලකුණු සම්බන්ධ නිවේදන රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම	9561	4758	50%
5	වෙළඳ ලකුණු ලියාපදිංචි සහතික නිකුත් කිරීම	7380	5461	74%
6	ලියාපදිංචිය අලුත් කළ අයදුම්පත් සංඛ්‍යාව	4465	3848	86%
7	පැවරුම් වාර්තා කර තැබීම	1115	1233	111%
8	නම/ලිපිනය සිදු වන වෙනස් වීම් වාර්තා කර තැබීම	1859	2292	123%

COVID 19 වසංගත තත්ත්වය මත මාස දෙකකට ආසන්න කාලයක් පූර්ණ වශයෙන් සහ තවත් මාස දෙකකට ආසන්න කාලයක් අර්ධ වශයෙන් රට වසා තබන ලද කාල වකවානුවක් තුළ, ආයතනය විසින් අනුගමනය කරන ලද, සීමිත පැමිණීම සහ නිවසේ සිට මාර්ගගත ක්‍රමයට රාජකාරි ඉටු කිරීම (WFH) යන ක්‍රමවේදයෙන් ඔස්සේ, වඩා දුෂ්කර රාජකාරිමය අවස්ථාවක වුව ද වෙළඳ ලකුණු අංශයෙහි ඇතැම් ක්‍රියාකාරකම් වලින් 100% වඩා ඉහළ ප්‍රගතියක් අත්කර ගැනීමට බුද්ධිමය දේපළ කාර්යාලයට හැකි වී තිබේ.


ප්‍රධාන ක්‍රියාකාරකම් 3ක් යටතේ වෙළඳ ලකුණු අංශයෙහි ප්‍රගතිය විශ්ලේෂණය සිදු කර තිබේ.

2.1.1 ලැබුණු අයදුම්පත් හා පරීක්ෂා කළ අයදුම්පත් අතර සංසන්දනය

වගුව - 2 : ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව

වර්ෂය	2017	2018	2019	2020	2021
ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව	11,282	11,483	10,385	9,593	9,947
සෝදිසි පරීක්ෂාව සිදු කළ අයදුම්පත් සංඛ්‍යාව	21,606	6,542	10,224	12,551	4,989

ප්‍රස්ථාරය - 1 : ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව




වගුව - 2 හා ප්‍රස්ථාරය - 1 මගින් 2021 වර්ෂය තුළ ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව හා පරීක්ෂා කළ අයදුම්පත් සංඛ්‍යාව අතර සංසන්දනයක් පෙන්නුම් කරයි. ඒ අනුව 2017 සිට 2021 දක්වා ලැබුණු අයදුම්පත් සංඛ්‍යාවෙහි ක්‍රමික පසුබෑමක් පෙන්නුම් කරන අතර සෝදිසි පරීක්ෂාව සිදු කරන ලද අයදුම්පත් සංඛ්‍යාව 2018 සිට ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කළ ද 2021 වර්ෂයේ දී පසුබෑමකට ලක්ව ඇතිබව පෙන්නුම් කෙරේ. කොවිඩ් වසංගත තත්ත්වය මත නිවසේ සිට රාජකාරි කිරීමේ දී ඇතැම් වැඩ පියවරයන් සම්පූර්ණ කිරීමේ ප්‍රායෝගික අපහසුතා මතුවීම මෙම තත්ත්වය ඇතිවීමට බලපා ඇති බව උපකල්පනය කළ හැකි ය.

2.1.2 ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව හා ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව අතර සංසන්දනය

වගුව - 3 : ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත්වලට සාපේක්ෂව ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව

වර්ෂය	2017	2018	2019	2020	2021
ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව	11,282	11,483	10,385	9,593	9,947
ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව	10,622	5,192	14,993	5,932	3,848

ප්‍රස්ථාරය - 2 : ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත්වලට සාපේක්ෂව ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව




වගුව - 3 හා ප්‍රස්ථාරය - 2 මගින් 2021 වර්ෂය තුළ ලැබී ඇති වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව හා ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව අතර සංසන්දනයක් පෙන්නුම් කරයි. ඒ අනුව වර්ෂයක් හැර වර්ෂයක් නිරීක්ෂණය කළ හැකි උච්ඡාවචනයෙහි වෙනසක් මෙවර නිරීක්ෂණය වන අතර ලැබුණු අයදුම්පත් වලට සාපේක්ෂව ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාවෙහි අපේක්ෂිත වර්ධනයක් මෙවර දැකිය නොහැකි විය. රටතුළ උද්ගතවූ කොවිඩ් 19 වසංගත තත්ත්වය මත ඇතැම් කාර්යාලීය කටයුතු සහ වැඩ පියවරයන් ඒ අයුරින්ම නිවසේ සිට වැඩ කිරීම (WFH) හරහා ආවරණය කිරීම සිදුකළ නොහැකි වීම මෙයට හේතු විය හැකි බව උපකල්පනය කළ හැකි ය.

2.1.3 ලියාපදිංචි කළ වෙළඳ ලකුණු දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය කිරීම

වගුව - 4 : ලියාපදිංචි කළ වෙළඳ ලකුණු දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය කිරීම

වර්ෂය	2017	2018	2019	2020	2021
දේශීය ලකුණු	6,324	1,998	5,250	2,442	2,734
විදේශීය ලකුණු	4,298	3,194	9,743	3,590	2,729

ප්‍රස්ථාරය - 3 : ලියාපදිංචි කළ වෙළඳ ලකුණු දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය කිරීම



වගුව - 4 හා ප්‍රස්ථාරය - 3 මගින් 2021 වර්ෂය තුළ ලැබී ඇති වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව දේශීය හා විදේශීය වශයෙන් වෙන් කර පෙන්නුම් කරයි.

කොවිඩ් තත්ත්වය ආරම්භයේ දී දේශීය වෙළඳ ලකුණු වලට සාපේක්ෂව විදේශීය වෙළඳ ලකුණු ලියාපදිංචිය ඉහළ ගොස් තිබූ නමුත්, 2021 වන විට ආසන්න වශයෙන් සම මට්ටමක් දක්වා පහත බැස තිබේ. කෙසේ වුව ද සමස්ථ ලියාපදිංචි කිරීම් සංඛ්‍යාවෙහි පසුබෑමක් නිරීක්ෂණය කළ හැකි අතර උද්ගත වූ වසංගත තත්ත්වය එයට හේතුවන්නට ඇති බව උපකල්පනය කළ හැකිය.

2.2 පේටන්ට් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

වගුව - 5 : 2021.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා පේටන්ට් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

	ක්‍රියාකාරකම්	භෞතික ප්‍රගතිය (ඉටු කරන ලද කාර්ය)		
		ඇස්තමේන්තු-ගත	සත්‍ය	%
1	පේටන්ට් අයදුම්පත් ලැබීම්	550	539	98%
2	අයදුම්පත් හා සම්බන්ධ මූලික පරීක්ෂාව (දේශීය / ජාත්‍යන්තර / පේටන්ට් සහයෝගිතා ගිවිසුම (PCT) යටතේ ගොනු කළ අයදුම්පත්)	550	660	120%
3	නවතාවය පිළිබඳ පරීක්ෂා කිරීම් (අයදුම්පත පේටන්ට් බලපත්‍රයක් ලබාදීමේ දී සපුරාලිය යුතු අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්දැයි සඳහා පරීක්ෂාව)	960	1084	113%
4	ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා ජර්නල් සැකසීම	4	8	200%
5	පේටන්ට් සම්බන්ධ නිවේදන රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම	200	222	111%
6	පේටන්ට් සහතික සකස් කිරීම	200	194	97%
7	ලියාපදිංචිය අලුත් කළ අයදුම්පත් සංඛ්‍යාව	530	313	59%
8	පොදු මහජනතාව සඳහා තොරතුරු සැපයීම/ දේශීය දත්ත සමුදායන් වෙත ප්‍රවේශ වී තොරතුරු ලබා ගැනීම	100	18	18%

COVID 19 වසංගත තත්ත්වය මත මාස දෙකකට ආසන්න කාලයක් පූර්ණ වශයෙන් සහ තවත් මාස දෙකකට ආසන්න කාලයක් අර්ධ වශයෙන් රට වසා තබන ලද කාල වකවානුවක් තුළ, ආයතනය විසින් අනුගමනය කරන ලද, සීමිත පැමිණීම සහ නිවසේ සිට මාර්ගගත ක්‍රමයට රාජකාරි ඉටු කිරීම (WFH) යන ක්‍රමවේදයෙන් ඔස්සේ, වඩා දුෂ්කර රාජකාරිමය අවස්ථාවක වුව ද පේටන්ට් අංශයෙහි ඇතැම් ක්‍රියාකාරකම් වලින් 100% වඩා ඉහළ ප්‍රගතියක් අත්කර ගැනීමට බුද්ධිමය දේපළ කාර්යාලයට හැකි වී තිබේ.


ප්‍රධාන ක්‍රියාකාරකම් 3ක් යටතේ පේටන්ට් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධන විශ්ලේෂණය සිදු කර තිබේ.

2.2.1 ලැබුණු පේටන්ට් අයදුම්පත් වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව සිදු කළ අයදුම්පත් සංඛ්‍යාව

වගුව - 6 : ලැබුණු පේටන්ට් අයදුම්පත් වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව සිදු කළ අයදුම්පත් සංඛ්‍යාව

වර්ෂය	2017	2018	2019	2020	2021
ලැබුණු පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාව	543	603	611	603	539
සෝදිසි පරීක්ෂාව සිදු කළ අයදුම්පත් සංඛ්‍යාව	1,120	1,059	1,117	922	1084

ප්‍රස්ථාරය - 4 : ලැබුණු පේටන්ට් අයදුම්පත් වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව සිදු කළ අයදුම්පත් සංඛ්‍යාව




වගුව - 6 හා ප්‍රස්ථාරය - 4 මගින් 2021 වර්ෂය තුළ ලැබී ඇති පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාව හා පරීක්ෂා කළ අයදුම්පත් සංඛ්‍යාව පෙන්නුම් කරයි. ලැබුණු පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාවට සාපේක්ෂව ඉතා ඉහළ පරීක්ෂා කිරීම් සංඛ්‍යාවක් සිදු කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව පේටන්ට් අංශයේ දැනට අතපසු වී ඇති වැඩ ප්‍රමාණයෙහි කැපී පෙනෙන අඩු වීමක් ඉදිරියේ දී අපේක්ෂා කළ හැකි වේ.

2.2.2 ලැබුණු පේටන්ට් අයදුම්පත්වලට සාපේක්ෂව පේටන්ට් බලපත්‍ර ලබා දුන් සංඛ්‍යාව

වගුව - 7 : ලැබුණු පේටන්ට් අයදුම්පත්වලට සාපේක්ෂව පේටන්ට් බලපත්‍ර ලබා දුන් සංඛ්‍යාව

වර්ෂය	2017	2018	2019	2020	2021
ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව	543	603	611	604	539
පේටන්ට බලපත්‍ර ලබා දුන් සංඛ්‍යාව	181	212	175	273	194

ප්‍රස්ථාරය - 5 : ලැබුණු පේටන්ට් අයදුම්පත්වලට සාපේක්ෂව පේටන්ට් බලපත්‍ර ලබා දුන් සංඛ්‍යාව



වගුව - 7 හා ප්‍රස්ථාරය - 5 මගින් 2021 වර්ෂය තුළ ලැබී ඇති පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාව හා පේටන්ට් බලපත්‍ර ලබා දුන් සංඛ්‍යාව පෙන්නුම් කරයි.


ලැබෙන අයදුම්පත් සංඛ්‍යාවෙන් ප්‍රතික්ෂේප වන අයදුම්පත් සංඛ්‍යාව අතර අනුපාතයෙහි සැලකිය යුතු වෙනසක් පෙන්නුම් කර නොමැත. එසේ වුව ද පෙර වර්ෂයට සාපේක්ෂව ලැබුණු අයදුම්පත් ප්‍රමාණයෙහි සේම පේටන්ට් බලපත්‍ර ලබා දුන් සංඛ්‍යාවෙහි ද අඩුවීමක් නිරීක්ෂණය කළ හැකි ය. කොවිඩ් 19 තත්ත්වය මත ඇති වූ නව අවස්ථාවන් හේතුවෙන් 2019-2020 කාල වකවානුව තුළ ඉහළ ගිය විදේශීය පේටන්ට් අයදුම්පත් ප්‍රමාණය, 2021 වන විට ක්‍රමිකව අඩු වීම මේ සඳහා හේතු වූ බව උපකල්පනය කළ හැකි ය.

2.2.3 පේටන්ට් බලපත්‍ර ලබා දුන් අයදුම්පත් දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය

වගුව - 8 : ලියාපදිංචි කළ පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය කිරීම

වර්ෂය	2017	2018	2019	2020	2021
දේශීය	54	64	39	47	66
විදේශීය	127	148	136	226	128

ප්‍රස්ථාරය - 6 : පේටන්ට් බලපත්‍ර ලබා දුන් අයදුම්පත් දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය



වගුව - 8 හා ප්‍රස්ථාරය - 6 මගින් 2021 වර්ෂය තුළ ලැබී ඇති පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාව, දේශීය හා විදේශීය වශයෙන් වෙන් කර පෙන්නුම් කරයි. 2019 වසරේ දී COVID 19 වසංගත තත්ත්වය මත ඇති වූ නව අවස්ථාවන් උපයෝගී කර ගනිමින් විදේශීය පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාවෙහි කැපී පෙනෙන වර්ධනයක් 2020 වන විට නිරීක්ෂණය වන අතර එය 2021 වන විට ක්‍රමික අඩුවීමක් පෙන්නුම් කරයි. කොවිඩ් අර්බුද මත දේශීය අයදුම්පත් ප්‍රමාණය 2019 දී ක්ෂණික පහල යාමක් නිරීක්ෂණය වන නමුත් 2021 වන විට එහි ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරයි.

2.3 කාර්මික සැලසුම් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

වගුව - 9 : 2021.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා කාර්මික සැලසුම් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

	ක්‍රියාකාරකම්	භෞතික ප්‍රගතිය (ඉටු කරන ලද කාර්ය)		
		ඇස්තමේන්තු ගත	සත්‍ය	%
1	කාර්මික සැලසුම් අයදුම්පත් ලැබීම්	182	139	76%
2	අයදුම්පත් හා සම්බන්ධ මූලික පරීක්ෂාව (දේශීය / ජාත්‍යන්තර අයදුම්පත්)	182	252	138%
3	අයදුම්පත්වල සෝදිසි පරීක්ෂාව	182	164	90%
4	ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා ජර්නල් සැකසීම	4	5	125%
5	කාර්මික සැලසුම් සම්බන්ධ නිවේදන රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම	120	79	66%
6	කාර්මික සැලසුම් සඳහා සහතික පත් සැකසීම	120	99	83%
7	ලියාපදිංචිය අලුත් කළ අයදුම්පත් සංඛ්‍යාව	230	121	53%
8	පොදු මහජනතාව සඳහා තොරතුරු සැපයීම/ දේශීය දත්ත සමුදායන් වෙත ප්‍රවේශ වී තොරතුරු ලබා ගැනීම	50	18	36%

මේ අනුව, COVID 19 වසංගත තත්ත්වය මත මාස දෙකකට ආසන්න කාලයක් පූර්ණ වශයෙන් සහ තවත් මාස දෙකකට ආසන්න කාලයක් අර්ධ වශයෙන් රට වසා තබන ලද කාල වකවානුවක් තුළ, ආයතනය විසින් අනුගමනය කරන ලද, සීමිත පැමිණීම සහ නිවසේ සිට මාර්ගගත ක්‍රමයට රාජකාරි ඉටු කිරීම (WFH) යන ක්‍රමවේදයෙන් ඔස්සේ, වඩා දුෂ්කර රාජකාරිමය අවස්ථාවක වුව ද කාර්මික සැලසුම් අංශයෙහි ඉහළ ප්‍රගතියක් අත්කර ගැනීමට බුද්ධිමය දේපළ කාර්යාලයට හැකි වී තිබේ.


ප්‍රධාන ක්‍රියාකාරකම් 3ක් යටතේ කාර්මික සැලසුම් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය විශ්ලේෂණය සිදු කර තිබේ.

2.3.1 ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව

වගුව - 10 : ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව

වර්ෂය	2017	2018	2019	2020	2021
ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව	336	288	546	281	139
සෝදිසි පරීක්ෂාව සිදු කළ අයදුම්පත් සංඛ්‍යාව	259	242	449	288	164

ප්‍රස්ථාරය - 7 : ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව



වගුව - 10 හා ප්‍රස්ථාරය - 7 මගින් 2021 වර්ෂය තුළ ලැබී ඇති කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව හා පරීක්ෂා කළ කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව පෙන්නුම් කරයි.


ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව සහ පරීක්ෂාවට ලක් කරන සංඛ්‍යාව අතර පවතින අඩු පරතරය මගින් සහ 2021 වසරේ දී පරීක්ෂාවට ලක් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව, ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව ඉක්මවා යාම මගින් මෙම අංශයෙහි අතපසු වූ කාර්යයන් අවම බව පෙන්නුම් කරයි. එසේම 2020 සහ 2021 වර්ෂ වල දී ලැබෙන අයදුම්පත් සංඛ්‍යාවෙහි සිදුව ඇති සීඝ්‍ර පසු බෑම මගින් මෙම වකවානුව තුළ දේශීය ආර්ථිකයෙහි සිදුවන ලද සංකෝචනය සම්බන්ධව යම් ඉඟියක් ලබා දෙන බවට උපකල්පනය කළ හැකි ය.

2.3.2. ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව

වගුව - 11 : ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව

වර්ෂය	2017	2018	2019	2020	2021
ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව	336	288	546	281	139
ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව	330	124	258	151	99

ප්‍රස්ථාරය - 8 : ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව ලියාපදිංචි කරන ලද අයදුම්පත් සංඛ්‍යාව



වගුව - 11 හා ප්‍රස්ථාරය - 8 මගින් 2021 වර්ෂය තුළ ලැබී ඇති කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව හා ලියාපදිංචි කළ කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව පෙන්නුම් කරයි.


කොවිඩ් 19 වසංගත තත්ත්වය මත ලොව පුරා නව නිර්මාණවල සිදුවන ලද වර්ධනය 2019 දී පෙන්නුම් කරනු ලබන ඉහළ අයදුම්පත් සංඛ්‍යාවෙන් පිළිඹිබු වේ. එසේ නමුත් අනතුරුව ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත් ප්‍රමාණයෙහි පෙන්නුම් කරනු ලබන පසුබෑම මගින් 2021 වන විට දේශීය ආර්ථිකයෙහි සිදුව ඇති සංකෝචනය නිරූපනය වන බවට උපකල්පනය කළ හැකි ය.

2.3.2 ලියාපදිංචි කළ කාර්මික සැලසුම් දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය

වගුව - 12 : ලියාපදිංචි කළ කාර්මික සැලසුම් දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය

වර්ෂය	2017	2018	2019	2020	2021
දේශීය	189	86	197	122	54
විදේශීය	141	38	61	29	45

ප්‍රස්ථාරය - 9 : ලියාපදිංචි කළ කාර්මික සැලසුම් දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය



වගුව - 12 හා ප්‍රස්ථාරය - 9 මගින් 2021 වර්ෂය තුළ ලැබී ඇති කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව දේශීය හා විදේශීය වශයෙන් වෙන් කර පෙන්නුම් කරයි. 2017 සිට 2020 කාල පරාසය තුළ මුළු ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාවෙන් දේශීය අයදුම්පත් සංඛ්‍යාවට සාපේක්ෂව විදේශීය අයදුම්පත් සංඛ්‍යාවෙහි අඩු වීමක් නිරීක්ෂණය වන නමුත් 2021 වර්ෂයේ දී එහි සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි.

2.4 විශේෂ ජයග්‍රහන

- වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ පහසුකම් සපයන මැඩ්රිඩ් සන්ධාන පත්‍රය වෙත ප්‍රවේශ වීම සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය වෙත අයදුම් කිරීමට හා බුද්ධිමය දේපළ පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබේ. ඒ අනුව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති සංශෝධිත යෝජනා ඇතුළත් පනත් කෙටුම්පත සඳහා, මේ වන විට ආයතනයෙහි නිරීක්ෂණ සකසමින් පවතී.

- ගීතයක් හෝ සංගීතමය කෘතියක් ගුවන් විදුලියේ එක් වරක් විකාශනය කිරීමේ දී රු. 20ක අවම මුදලක් හා රූපවාහිනී නාලිකාවකින් විකාශනය කිරීමේ දී රු. 100ක අවම මුදලක් එම ගීතය වෙනුවෙන් කෘතිභාගය ලෙස ගෙවිය යුතු බව නියම කරමින් කෘතිභාග අයිතිය සංගීත ක්ෂේත්‍රයේ කලාකරුවන් වෙත හිමි කර දීම සම්බන්ධයෙන් අවම ගාස්තු නියම කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් කරන ලද්දේ 2020 වර්ෂයේ දී ය. ඒ අනුව මෙම වසරේ දී (2021 දී), ගරු වෙළෙඳ අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි , මාධ්‍ය හරහා විකාශනය වන නවක ගායක ගායකයින් තේරීමේ තරඟවල දී (රියලිටි තරඟ) ගැයෙන ගීතවල ප්‍රකාශන හිමිකම් වෙනුවෙන් කෘතිභාග අයකරගැනීම ඇතුළු ආශ්‍රිත කරුණු පිළිබඳ අධ්‍යයනයකර වාර්තාවක් සැකසීම සඳහා, අමාත්‍යාංශ නිලධාරියකුගේ සභාපතීත්වයෙන් සහ බුද්ධිමය අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු රජයේ ආයතන නියෝජනය වන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් අමාත්‍යාංශ ලේකම් විසින් පත් කර තිබේ.

- භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම අරමුණුකර, බුද්ධිමය දේපළ පනතට සඳහා යෝජිත සංශෝධන නීති කෙටුම්පත් දෙපාතමේන්තුව අනුමත කළ පසු අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබාදීමෙන් පසු අමාත්‍යමණ්ඩල පත්‍රිකා කෙටුම්පත වෙළෙඳ අමාත්‍යාංශය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

- පොදු ජනතාවට පේටන්ට් තොරතුරු වෙත ප්‍රවේශ වීමේ පහසුකම් වැඩි කිරීම සඳහා නව තාක්ෂණ හා නවෝත්පාදන සහයෝගිතා මධ්‍යස්ථාන (TISC) දෙකක් ස්ථාපනය කිරීමට අදාළ මූලික කටයුතු ආරම්භ කර ඇත.

- මරකේෂ් ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව තුළ ඇති කළයුතු ක්‍රියාත්මක කිරීම් සම්බන්ධයෙන් බුද්ධිමය දේපළ පනතට ඇතුළත් කළයුතු සංශෝධනයන් සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබී ඇත.

- ශ්‍රී ලංකාව තුළ සංයුක්ත පරිපථ සඳහා වූ පිරිසැලසුම් නිර්මාණ (Layout Designs of Integrated Circuits) ලියාපදිංචි කිරීමේ පහසුකම් ඇති කිරීම සඳහා මූලික අධ්‍යයන කටයුතු සිදු කරමින් පවතී.

- පේටන්ට් හා කාර්මික සැලසුම් ලිපි ගොනු සුරක්ෂිත කිරීම, අයදුම්පත් පරීක්ෂා කිරීමේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම, දත්ත සඳහා ප්‍රවේශය වේගවත් කිරීම සඳහා සැලසුම් කරන ලද ගොනු ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා මෙම වසර තුළ ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීමට අදාළ මූලික කාර්යයන් ආරම්භ කිරීමට හැකියාව ලැබී ඇත.

- දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධිමය දේපළ නවෝත්පාදනයන් සහ වාණිජකරණය වේගවත් කිරීම සඳහා බුද්ධිමය දේපළ පරිසර පද්ධතියක් (EIE) ගොඩනැගීමේ ව්‍යාපෘතිය යටතේ ධාරිතා සංවර්ධනය සඳහා ශිෂ්‍යත්ව පිරිනමන වැඩසටහනක් මෙම වසරේ සංවිධානය කරන ලදී.

- පනත සංශෝධනය කිරීම හා නව රෙගුලාසි සකස් කිරීම වැනි ප්‍රතිපත්ති මට්ටමේ තීරණ ගැනීම සඳහා පවත්වනු ලබන බුද්ධිමය දේපළ උපදේශක කමිටු රැස්වීම් 4ක් කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ වුවද සාර්ථකව පැවැත්වීමට හැකි වී ඇත.

- කොවිඩ් 19 වසංගත පැවති කාලය තුළ අයැදුම්කරුවන්ට සහ සේවා ලාභීන්ට සේවා සැපයීම සඳහා මාර්ග-ගත අයදුම්පත් ගොනු කිරීමේ ක්‍රමවේදයක් මහජනතාවට හඳුන්වා දීමට හැකියාව ලැබුණු අතර ඒ අනුව අඛණ්ඩව සේවා පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇත.

- කොවිඩ් 19 වසංගත තත්ත්වය කළමනාකරණය කර ගනිමින් මාර්ගගත ක්‍රමයට බුද්ධිමය දේපළ විෂය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්පාදනය කිරීම සහ සම්පත් දායකත්වය ලබා දීමට හැකිවී තිබේ.

- කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ Zoom/ Team තාක්ෂණ ක්‍රමවේදය යටතේ ලෝක බුද්ධිමය දේපළ කාර්යාලය ඇතුළු විවිධ ආයතන විසින් පවත්වන වැඩමුළු සඳහා බුද්ධිමය දේපළ නිලධාරීන් සහ බාහිර ආයතන සහභාගීකරවමින් බුද්ධිමය දේපළ පිළිබඳ දැනුම ලබා දීමට කටයුතු කරන ලදි.

- ජාත්‍යන්තර පාරිභෝගික දිනය 2021 සැමරීම වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් සිය පාරිභෝගිකයන් සඳහා ජංගම සේවා කඳවුරක් පැවැත්වීමට කටයුතු කර තිබේ.





ජාත්‍යන්තර පාරිභෝගික දිනය 2021- ජංගම සේවා කඳවුරක් පැවැත්වීම

2.5 අභියෝග

- ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් නොපැවතීම සහ ප්‍රමාණවත් ඉඩපහසුකම් නොවීම.

මෙම දෙපාර්තමේන්තුව 1993 සිට මේ දක්වා වසර 28කට අධික කාලයක් මුළුල්ලේ පවත්වාගෙන යනු ලබන්නේ, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට අයත්, සමාගම් මැදුර ගොඩනැගිල්ලෙහි, කුලී පදනම මත ලබාගත්, 3 වන මහලෙහි සහ 2 වන මහලෙහි කොටසක් අයත් වන, සීමිත කාර්යාලීය ඉඩ ප්‍රමාණයක ය. ගොඩනැගිල්ලෙහි මෙම ඉඩ ප්‍රමාණය ද ආපසු ලබා දෙන ලෙස වසර 07 කට අධික කාලයක් තිස්සේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන ඉල්ලීම් අනුව, ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය වෙනත් සුදුසු ස්ථානයක ස්ථිරව ස්ථාන ගත කිරීම සඳහා ප්‍රයත්න දරන ලදී.
මෙම සමාලෝචිත කාල සීමාව තුළ දී නාගරික සංවර්ධන අධිකාරියට අයත් බත්තරමුල්ල ප්‍රදේශයෙහි පිහිටි අඩක් නිම කරන ලද ගොඩනැගිල්ලක් සහිත ඉඩමක් දීර්ඝ කාලීන බදු පදනම යටතේ ආයතනය වෙත පවරා ගැනීමෙන් අනතුරුව අදාළ ගොඩනැගිල්ල නවීකරණය කොට එහි බුද්ධිමය දේපළ කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදීමේ හා ඉදිරි කටයුතු ඉටු කිරීම ආරම්භ කර ඇත.

- ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි මෘදුකාංග පද්ධතිය වන කාර්මික දේපළ පරිපාලන පද්ධතිය (Industrial Property Administration System-IPAS) වැඩිදියුණු කිරීමේ දුෂ්කරතාවය.

ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි මෘදුකාංග පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා e-NIPO ව්‍යාපෘතිය ස්ථාපිත කිරීමට ශ්‍රී ලංකා තොරතුරු සහ සංනිවේදන නියෝජිතායතනය (ICTA) සමඟ 2016 වසරේ දී එලඹෙන ලද අවබෝධතා ගිවිසුම අනුව, එම ආයතනය ගිවිසුම්ගත කාර්යයන් ඉටුකර දීමට අපොහොසත්වීම හේතුවෙන් e-NIPO ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම අඩාල වන ලදී. මෙම අර්බුදය හේතුවෙන් මෘදුකාංග පද්ධතිය වැඩිදියුණු කිරීම ප්‍රමාද වී ඇත. කෙසේ නමුත් මේ සම්බන්ධයෙන් විසඳුමක් ලබා ගැනීම සඳහා බුද්ධිමය දේපළ කාර්යාලය විසින් ලබා දී ඇති මුදල ද සලකා බලා, 2020 වසරේ ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයකට ලද අනුමැතිය පරිදි මෙම ව්‍යාපෘතිය ඉටු කර ගැනීමට අවශ්‍ය සහය ICTA ආයතනය මගින් ලබා දිය යුතු බවට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇත.

ඒ අනුව, මෙම සමාලෝචිත කාල සීමාව තුළ දී ශ්‍රී ලංකා තොරතුරු සහ සංනිවේදන නියෝජිතායතනය හා එළඹීමට යෝජිත නව අවබෝධතා ගිවිසුමෙහි කෙටුම්පත ගරු නීතිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබේ.

- මැඩ්රිඩ් ප්‍රඥප්තියට අනුගත වීම

ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය ඇතුළත් මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශ වීම හා එයට අනුකූල වන ලෙස බුද්ධිමය දේපළ පනත සංශෝධනය කිරීම හඳුනා ගන්නා ලද අභියෝගයක් වේ.

2.6 ඉදිරි ඉලක්ක

<u>කෙටි කාලීන ඉලක්ක</u>

- ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය පවත්වාගෙන යාමට සුදුසු ගොඩනැගිල්ලක් ලබා ගැනීම හෝ ස්ථිර කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සහ ඵලදායිතාවය වැඩි වන ලෙස කාර්යාලය ප්‍රතිව්‍යුහගත කිරීම

- බුද්ධිමය දේපළ පනතට යෝජිත සංශෝධනයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු, ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය ඇතුළත් මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශ වීම

- ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය ආකර්ෂණීය සහ ඉහළ ඵලදායිතාවක් සහිත රාජ්‍ය ආයතනයක් බවට නහාලීම

- පොදු ජනතාවට පේටන්ට් තොරතුරු වෙත ප්‍රවේශ වීමේ පහසුකම් වැඩි කිරීම සඳහා නව තාක්ෂණ හා නවෝත්පාදන සහයෝගිතා මධ්‍යස්ථාන 2ක් (TISCs) 2022 වසර තුළ දී ස්ථාපනය කිරීම

- සංයුක්ත පරිපථ සඳහා වූ පිරිසැලසුම් නිර්මාණ (Layout Designs of Integrated Circuits) ලියාපදිංචි කිරීම පිළිබඳ මූලික අධ්‍යයන කටයුතු අවසන් කිරීමට කටයුතු කිරීම

- කාර්මික සැලසුම් ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සපයන හේග් (Hague) පද්ධතියට ප්‍රවේශ වීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීම හා ඒ සම්බන්ධව උපදේශන රැස්වීම් පැවැත්වීම

- ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා මාර්ගගත ගෙවීම් ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම

- දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධිමය දේපළ නවෝත්පාදනයන් සහ වාණිජකරණය වේගවත් කිරීම සඳහා බුද්ධිමය දේපළ පරිසර පද්ධතියක් (EIE) ගොඩනැගීමේ ව්‍යාපෘතිය සඳහා වැඩමුළු පැවැත්වීම

- භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ පහසුකම් සැලසීම

  ද්‍රව්‍යයක හෝ නිෂ්පාදිතයක සම්භවය කිසියම් නිශ්චිත භූගෝලීය ප්‍රදේශයක බවත් එහි විශේෂ ගුණාංග, ගති ලක්ෂණ හා කීර්තිනාමයක් එම භූගෝලීය සම්භවයේ හේතුවෙන් ඇතිවී ඇති බැව් පාරිභෝගිකයන්ට හා වෙළෙඳුන්ට පෙන්නුම් කිරීම සඳහා භූගෝලීය දර්ශක භාවිතා කරනු ලබයි. භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම මගින් ලංකා තේ, ලංකා කුරුඳු ආදී භූගෝලීයව වැදගත්කම් දරන ශ්‍රී ලංකාවට ආවේණික නිෂ්පාදන සඳහා පුළුල් විදේශීය වෙළෙඳපොළක් ඇති කර ගැනීමට අපේක්ෂිත ය. දැනට ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සතුව භූගෝලීය දර්ශක විශේෂිතව ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් නොමැති අතර සහතික ලකුණු ලියාපදිංචි කිරීම පමණක් මෙතෙක් සිදු කර ඇත. අදාළ නීති කෙටුම්පත් අනුමත වූ පසු භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ පහසුකම් ලබා දීමට හැකිවනු ඇත

- ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි මෘදුකාංග පද්ධතිය වන කාර්මික දේපළ පරිපාලන පද්ධතිය (Industrial Property Administration System-IPAS) එහි ආසන්නතම ඉහළ යාවත්කාලීන කිරීම් දක්වා වැඩිදියුණු කිරීම

- ලිපි ගොනු ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය හඳුන්වා දීම

<u>දිගුකාලීන ඉලක්ක</u>

- පේටන්ට් සහ පේටන්ට් නොවන තාක්ෂණික තොරතුරු සඳහා මහජන ප්‍රවේශය වැඩි කිරීම
- බුද්ධිමය දේපළ පරිසර පද්ධතියක් (EIE) ගොඩනැගීම
- සංයුක්ත පරිපථ (Integrated Circuit (IC)) සඳහා පිරිසැලසුම් නිර්මාණ ලියාපදිංචි කිරීමේ පහසුකම් සැලසීම
- කාර්මික සැලසුම් ජාත්‍යන්තර ව ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සපයන හේග් (Hague) පද්ධතියට ප්‍රවේශ වීම
- විද්‍යුත් මාධ්‍යවල විකාශනය වන ගීත, සංගීතමය කලා නිර්මාණ සඳහා මුල් නිර්මාණ කරුවන්ට කතෘ-භාගය ගෙවීම සම්බන්ධව යාන්ත්‍රණය තව දුරටත් දියුණු කිරීම

ගීතාංජලී ආර්. රණවක
බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

අ). බුද්ධිමය දේපළ අරමුදල

3.1 මූල්‍ය ප්‍රකාශන

3.2 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

3.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්යසාධනය

3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

3.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ආ). ශීර්ෂය - 299

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

3.අ). මූලික කාර්යසාධනය - බුද්ධිමය දේපළ අරමුදල

3.අ.1 මූල්‍ය ප්‍රකාශන - බුද්ධිමය දේපළ අරමුදල

බුද්ධිමය දේපළ අරමුදල

2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

	සටහන්	2021.12.31	2020.12.31
අයභාරය		රු	රු
වෙළඳ ලකුණු ආදායම්	3	70,271,480	55,822,249
ජේටන්ට් ආදායම්	3	6,951,459	7,108,482
කාර්මික සැලසුම් ආදායම්	3	561,207	533,638
වෙනත් ආදායම්	4	381,176	473,269
ආයෝජන පොලී ආදායම්	5	43,062,272	64,241.112
මුළු අයභාරය		**121,227,595**	**128,178,750**
වියදම්			
වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ	2	2,443,119	2,691,540
ප්‍රදාන හා වෙනත් හුවමාරු ගෙවීම්	2	1,263,585	1,077,030
සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය	2	40,956,811	50,079,471
වෙනත්	2	529,177	103,235
ක්ෂය සහ ක්‍රම ක්ෂය	2	7,212,801	7,175,802
මූල්‍ය පිරිවැය	2	-	-
මුළු වියදම්		**52,405,494**	**61,127,078**
කාල පරිච්ඡේදය සඳහා වුඅනිරීක්ෂය/(ඌනතාවය) /අයභාරය		**68,822,100**	**67,051,672**

බුද්ධිමය දේපළ අරමුදල

2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන්	2021.12.31	2020.12.31
		රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් හා සමාන විෂයයන්	8	2,411,558	1,886,552
ලැබිය යුතු ආදායම	9	31,387,410	8,829,362
කෙටි කාලීන ආයෝජන	7	898,540,693	851,641,767
ඉදිරියට කළ ගෙවීම	11	5,345	5,236
		932,345,005	862,362,917
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	6	31,460,226	35,324,725
ලැබිය යුතු ප්‍රතිපූර්ණය කිරීම - බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථාන		22,298,751	22,298,751
		53,758,977	57,623,477
මුළු වත්කම්		986,103,982	919,986,394
බැරකම්			
ජංගම බැරකම්			
උපචිත වියදම්	12	3,816,701	10,111,763
ජංගම නොවන බැරකම්		-	-
මුළු බැරකම්		3,816,701	10,111,763
ශුද්ධ වත්කම්		982,287,281	909,874,631
ශුද්ධ වත්කම්/ ස්වාමිත්වය			
සමුච්චිත අතිරික්තය / ඌණතාවය	10	982,287,281	909,874,631
ශුද්ධ වත්කම්/ස්වාමිත්වය		982,287,281	909,874,631

ආර්.පී.එස්. රාජපක්ෂ
ගණකාධිකාරී
ආර්.පී.එස්. රාජපක්ෂ
ගණකාධිකාරී
ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය
පණාගම මැදුර, 3වන මහල,
400, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.

ගීතාංජලී. ආර්. රණවක
බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්
ගී. ආර්. රණවක (මිය)
බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්
ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය,
පණාගම මැදුර, 3 වන මහල,
400, ඩී. ආර්. විජයවර්ධන මාවත,
කොළඹ 10.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආ.ක්‍ර.ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව බුද්ධිමය දේපළ අරමුදලේ ගණන් විගණනය කිරීමේ කාර්යය සඳහා 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතෙහි176 (5) වගන්තිය අනුව සකස් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශය 2022.02.28 දින අනුමත කරන ලදී.

ජේ.එම් හදානි ජයවර්ධන
ලේකම්
වෙළඳ අමාත්‍යාංශය

ජේ. එම්. හදානි ජයවර්ධන
ලේකම්
වෙළෙඳ අමාත්‍යාංශය
අංක.492, ආර්. ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

Page 1

ලුද්ධිමය දේපළ අරමුදල


2021. 12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

සෘජු ක්‍රමය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2021.12.31	2020.12.31
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය	රු	රු
ලැබීම්		
බදු	2,925	2,175
භාණ්ඩ හා සේවා විකිණීමෙන්	116,676,219	95,196,554
පොලී ලැබීම්	20,504,224	106,071,184
අනෙකුත් ලැබීම්	782,372	1,013,473
ගෙවීම්		
සේවක පිරිවැය	(2,469,733)	(2,742,271)
සැපයුම්කරුවන්ට ගෙවීම්	(43,625,775)	(45,664,349)
අනෙකුත් ගෙවීම්	(1,757,472)	(1,606,526)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**90,112,760**	**152,270,241**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්		
පිරියත හා උපකරණවලදී ගැනීම්	(3,628,840)	(665,654)
පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබීම්	-	-
ආයෝජන කල්පිරීමෙන් ලැබීම්	895,641,676	1,381,471,716
ආයෝජන මිලදී ගැනීම්	(942,540,602)	(1,501,163,963)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**(50,527,766)**	**(120,357,901)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්		
බදු මුදල් ආපසු ගෙවීම්	-	-
රජයට ලාභදායීත්වය	(39,059,989)	(31,732,185)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**(39,059,989)**	**(31,732,185)**
මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩි වීම/ (අඩුවීම)	525,005	180,155
2021.01.01 දිනට මුදල් හා මුදල් හා සමාන දෑ	1,886,552	1,706,397
2021.12.31 දිනට මුදල් හා මුදල් හා සමාන දෑ	**2,411,558**	**1,886,552**

බුද්ධිමය දේපළ අරමුදල

2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය



බුද්ධිමය දේපළ අරමුදල

2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	රඳවාගත් ලාභය/ අලාභය	වෙනත් සංචිත	එකතුව
	රු.	රු.	රු.	රු.
2020.01.01 දිනට ශේෂය	843,728,223	-	-	843,728,223
පූර්ව වර්ෂ ගැලපුම්	-	(905,264)	-	(905,264)
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	67,051,672	-	67,051,672
2020.12.31 දිනට ශේෂය	**843,728,223**	**66,146,408**	**-**	**909,874,631**
2021.01.01 දිනට ශේෂය	909,874,631	-	-	909,874,631
පූර්ව වර්ෂ ගැලපුම්	-	3,590,550	-	3,590,550
ප්‍රත්‍යාගණන ලාභය	(5,578,250)	-	5,578,250	-
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	68,822,100	-	68,822,100
2021.12.31 දිනට ශේෂය	**904,296,381**	**72,412,650**	**5,578,250**	**982,287,281**

අවසාන ගිණුම් සඳහා අදාළ වන ගිණුම් ප්‍රතිපත්ති

මූලික ගිණුම් ප්‍රතිපත්ති සහ ප්‍රකාශන

- 2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.
- මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.
- ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් පිළියෙල කර ඇත.
- මූල්‍ය වාර්තා සකස් කිරීමේ දී පදනම් කර ඇත්තේ ඓතිහාසික පිරිවැය සංකල්පය වේ. මෙම ගිණුම් ඉදිරිපත් කිරීමේ දී උද්ධමනය සඳහා ගැලපුම් කර නොමැත.
- ද්‍රව්‍යාත්මක බව, ඒකාකාරී බව හා අඛණ්ඩ පැවැත්ම, උපචිත පදනම් පිළිබඳ සංකල්පය පදනම් කර ගිණුම් ඉදිරිපත් කර ඇති අතර එම දී යථායෝග්‍යතාව පිළිබඳ සැලකිල්ලක් දක්වා ඇත.
- වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්ති
- ස්ථාවර වත්කම් සරල මාර්ග ක්ෂය පදනම මත වත්කම් වල ඵලදායී ජීවිත කාලය පුරා ක්ෂය කරනු ලැබේ. වත්කම් මිල දී ගත් වර්ෂයේ දී ක්ෂය කිරීම් කරනු නොලැබේ. වත්කම් ඉවත් කිරීමේ දී වත්කම් ඉවත්කරන දිනය හොයලනන අතර ඉවත්කරන සම්පූර්ණ වර්ෂය සඳහා ම ක්ෂය ගලපනු ලැබේ.

  වත්කම් ක්ෂය කිරීමේ අනුපාත.

කාර්යාල උපකරණ	10%
කාර්යාල සවි කිරීම්	10%
ලී බඩු හා උපකරණ	05%
මෝටර් රථ	10%
නිර රෙදි	20%
පොත් පත්	10%
පරිගණක	25%

- ආයෝජනයන් ඒවායේ මුහුණත අගය හා පිරිවැය යන අගයන් දෙකෙන් අඩු අගයට ගිණුම් ගත කර ඇති අතර ඒවායේ පිරිවැය මුහුණත අගයට වඩා වැඩි වන විට සිදු වන අලාභය එම අවස්ථාවේ දීම ගැලපීම් කර ඇති අතර පිරිවැය මුහුණත අගයට වඩා අඩු වන විට සිදු වන ලාභය ආයෝජනයන් උපලබ්ධි වන අවස්ථාවේ ගැලපීම් කර ඇත.
- උපචිත වියදම් 2022 පෙබරවාරි මස 20 දින දක්වා ගණනය කර ඇත.
- 2021.12.31 දිනට ඉතිරි ලිපි ද්‍රව්‍ය තොගය රු. 2,853,599.91කි.

❖ සේවා සැපයීම වෙනුවෙන් ගිණුම් වර්ෂයට අදාලව ලැබෙන ආදායම්, ගිණුම් වර්ෂයට අදාළ ව හඳුනා ගන්නා අතර ආයෝජන වෙනුවෙන් ලැබෙන ආදායම් කාලයට සමානුපාතික ක්‍රමයකට අනුව ගිණුම් ගත කර ඇත.

❖ බුද්ධිමය දේපළ අරමුදල පරිපාලනය කිරීමේ කටයුතු වෙනුවෙන් බුද්ධිමය දේපළ කාර්යාලයේ නිලධාරීන් සඳහා ගෙවනු ලබන වැටුප් හා දීමනා ඇතුළු අයහාර වියදම් සඳහා රු.44,401,355 ක මුදලක් විසර්ජන වැය ශීර්ෂය 299 යටතේ රජය විසින් දරනු ලැබ ඇත.

❖ අංක අමප/15/0272/625/007 හා 2015.04.23 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් බුද්ධිමය දේපළ ප්‍රවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීමට වැය කළ මුදල්, නාගරික සංවර්ධන අධිකාරියෙන් අය කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2015.04.23 දින ලැබී ඇත. එය අනුව අදාළ මුදල් ප්‍රතිපූරණය කරන මෙන් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලීම් කර තිබේ.

❖ බුද්ධිමය දේපළ අරමුදලට විරුද්ධව පැවරූ කිසිදු නඩුවක් නැත. බුද්ධිමය දේපළ කාර්යාලය ප්‍රධාන අවස්ථා දෙකක දී බුද්ධිමය දේපළ විෂයයට අදාලව පාර්ශවකරුවෙක් ලෙස නම් කරනු ලැබේ.

i. බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගන්නා ලද බුද්ධිමය දේපළ විෂයයට සම්බන්ධ ඒක - පාර්ශවීය නිරණයවලට, විශේෂයෙන් වෙළඳ ලකුණු අයදුම්පත් සම්බන්ධ නිරණයවලට එරෙහිව කොළඹ මහාධිකරණයට අයදුම්කරුවන් විසින් අභියාචනා කිරීම.

ii. වෙළඳ ලකුණු අයදුම්පත් සම්බන්ධ විරෝධතා ගොනු කිරීමක දී බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගනු ලබන නිරණයකට එරෙහිව අදාල පාර්ශව විසින් කොළඹ මහාධිකරණයට අභියාචනා කිරීම.

❖ ශේෂ පත්‍ර දිනට පසුව සිදුවීම් නොමැත.

❖ සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු සිදුකර නොමැත.

3.අ.2 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය - බුද්ධිමය දේපළ අරමුදල

වගුව - 13 : වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

(රු.000)

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදනය		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	87,113	87,113	52,405	60.16%
ප්‍රාග්ධන	8,000	8,000	3,629	45.36%

3.අ.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්යසාධනය - බුද්ධිමය දේපළ අරමුදල

වගුව - 14 : පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්යසාධනය

(රු.000)

පරිත්‍යාග කළ ආයතනය	පරිත්‍යාගයේ අරමුණ	පරිත්‍යාග මුදල
-	-	-

3.අ.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය - බුද්ධිමය දේපළ අරමුදල

වගුව - 15 : මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

(රු.000)

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ-අරමුදල	31,460	31,460	-	100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරී ගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.අ.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව - බුද්ධිමය දේපළ අරමුදල

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } පීඑබි/ඒ/අයිපීඑෆ්/එෆ්එස්/21/21 ඔබේ අංකය உமது இல. Your No. }
දිනය திகதி Date } 2022 මැයි 31 දින

අධ්‍යක්ෂ ජනරාල්,

බුද්ධිමය දේපළ අරමුදල.

බුද්ධිමය දේපළ අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

බුද්ධිමය දේපළ අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂය තුළ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම වලින් දෙසැම්බර් 31 දිනට ඉතිරිවී තිබූ ලිපිද්‍රව්‍ය තොගවල වටිනාකම රු.2,853,549 ක් ලෙස අගය කර තිබුණද අවසාන තොගයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු නොකර මුළු ලිපිද්‍රව්‍ය වියදම මූල්‍ය කාර්සාධන ප්‍රකාශනයට ගලපා තිබුණි.

(ආ) කාර්යාල පරිගණක 75 ක් සඳහා රු.222,725 ක් ගෙවා මිලදීගත් ප්‍රතිවෛරස් මෘදුකාංගවල වලංගු කාලය 2021 ජූලි සිට 2022 ජූලි දක්වා විය. එබැවින් ඉදිරි වර්ෂය වෙනුවෙන් දරන ලද රු.118,982 ක් සඳහා ගැලපීම් කළයුතු වුවත් එසේ නොකිරීම නිසා, සමාලෝචිත වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එම ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් භූමියක අයිතිය පවරා ගැනීමකින් තොරව බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකරමින් පැවතියදී ඒ ආශ්‍රිත ඉඩම් සංවාරක කර්මාන්ත සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත්කරගෙන තිබුණි. ඒ අනුව ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් වැය කළ රු.22,298,751 ක මුදල එම අධිකාරිය වෙතින් අයකරගැනීම සඳහා 2015 මාර්තු 15 දිනැති අංක අමප/15/0272/623/007 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් එම භූමිය තක්සේරුකර ඉහත මුදල බුද්ධිමය දේපළ කාර්යාලය වෙත මුදාහැරීම සම්බන්ධයෙන් සමුපකාර තොග වෙළඳ සංස්ථාව එකඟතාව පළ නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදීද එම මුදල නිරවුල් කර ගැනීමට නොහැකිවී තිබුණි.

(ආ) 2019 වර්ෂයේදී වැඩිපුර ගෙවා තිබූ රු.273,083 ක වැට බදු මුදල් සමාලෝචිත වර්ෂයේදීද අය කර ගෙන නොතිබුණි.

3.2 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීම

(i) 2021 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව 181 ක් වූ අතර ඉන් බලපත්‍ර 30 ක් 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුල ලද ඉල්ලුම්පත් විය. පනතේ 83(1) වගන්තිය අනුව පේටන්ට් බලපත්‍රයක වලංගු කාලය ඉල්ලුම්පත් ලද දිනයේ සිට අවුරුදු 20 ක් වන බැවින් ඉල්ලුම්පත් ලියාපදිංචි කිරීම සඳහා වසර 06 ත් වසර 13 ත් අතර කාලයක් ගතව තිබීමෙන් වලංගු කාලයෙන් වැඩි කොටසක් ලියාපදිංචි ක්‍රියාවලිය සඳහා වැය වී ඇති බව නිරීක්ෂණය විය. මේ අනුව පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමෙන් ඉල්ලුම්කරු බලාපොරොත්තු වන සුරක්ෂිතභාවය ඉටු වී නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි කරන ලද පේටන්ට් ගොනු 10 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී ද්විතීය පරීක්ෂාවේ දෝෂ නිවැරදි කිරීමට පනතේ 78(2)

වගන්තිය අනුව . දැනුම් දුන් දින සිට මාස 03 ක් ඉක්මවීමට පෙර කළ යුතු වුවත් ඒ සඳහා මාස 10ක සිට මාස 41 ක් අතර පරාසයක කාලයක් ගතකර තිබීම පේටන්ට් ලියාපදිංචි කිරීම ප්‍රමාද වීමට හේතුවක් වී තිබුණි.

(iii) ඉකුත් වර්ෂවලට අදාළ නිම නොකල ගොනු 600 ක් සමාලෝචිත වර්ෂයේ නිම කිරීමට සැලසුම් කර තිබුණද සැලසුම් කළ පරිදි එය ක්‍රියාත්මක වී නොතිබුණි. එම හේතුවෙන් පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රවලින් 2021 දෙසැම්බර් 31 දිනට නිම නොවූ පේටන්ට් ඉල්ලුම්පත්‍ර (ගොනු) සංඛ්‍යාව 1142 විය.

(ආ) පේටන්ට් සහ පේටන්ට් නොවන තාක්ෂණික දත්ත ගබඩා වෙත ප්‍රවේශවීමට පහසුකම් සැලසීමත්, ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේදී වන දෝෂ හේතුවෙන් ප්‍රතික්ෂේපවන ඉල්ලුම්පත් ප්‍රමාණය අඩුකර ගැනීමත් මූලික අරමුණු කරගෙන ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම තාක්ෂණ හා නවෝත්පාදන සහයෝගිතා මධ්‍යස්ථානයක් පිහිටුවීමට යෝජනා වී තිබුණි. ප්‍රතික්ෂේප වන ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව, ඉල්ලුම් කළ මුළු සංඛ්‍යාවෙන් සියයට 48 ක සිට සියයට 60 ක් අතර පරාසයක ඉහළ අගයක් ගැනීම අඩුකරගැනීමට, සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථාන දෙකක් පිහිටුවීමට සැලසුම් කර තිබුණද ඉන් එක් මධ්‍යස්ථානයක් පමණක් පිහිටුවා තිබුණි.

